# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1642/28 - 2010 පෙබරවාරි 26 වැනි සිකුරාදා - 2010.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ආදම්ලෙබ්බෙ තම්බිකණ්ඩු මොහමඩ් තම්බි නම් වූ සභිකයා අයත්වන එක්සත් ජාතික පක්ෂය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන අස්වර් උදුමා ලෙබ්බෙ මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අස්වර් උදුමා ලෙබ්බෙ මහතා සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
තේරීම්භාර නිලධාරී,
සම්මන්තුර ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 18 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

03-490/1

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම හේතු කොට ගෙන සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

නසීර් මොහමඩ් ආසික් නම් වූ සභිකයා අයත්වන එක්සත් ජාතික පක්ෂය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු වන ආදම්බාවා කෝසු මොහිඩීන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ආදම්බාවා කෝසු මොහිඩීන් මහතා සම්මන්තුර ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
තේරීම්භාර නිලධාරි,
සම්මන්තුර ප්‍රාදේශීය සභාව.

2010 පෙබරවාරි මස 18 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

03-490/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.